# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,753 — 1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. බී. 14/61. අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (8).

**1944 අංක 50 දරණ ගුවන් විදුලි සංදේශ ආඥපනත**

**8 වෙනි වගන්තිය යටතේ කරනු ලබන ආඥව**

1944 අංක 50 දරන ගුවන් විදුලි සංදේශ ආඥපනතේ 8 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර ඔලිවර් අර්නස්ට් ගුණතිලක වන මම, ප්‍රවාහන හා රජයේ වැඩ ඇමතිගේ අදහස් විමසීමෙන් පසු ව, විදුලි පණිවිඩ හා ගුවන් විදුලිය මගින් යැවීම සඳහා බාර දෙනු ලබන හෝ යවනු ලැබූ හෝ බාරගත් හැම පණිවිඩයක්ම, එය 1961 අංක 8 දරණ හදිසි (විවිධ විධි විධාන හා බලතල) නියෝගවල 23 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ කරනු ලැබූ ආඥවක් අනුව රඳවා ගනු ලැබූ යම් තැනැත්තකුට ලිපිනයෙන් යොමු කරනු ලැබ හෝ එබඳු තැනැත්තකු විසින් එවනු ලැබ ඇතහොත්, පොලිස්පති විසින් ඒ කාර්‍ය සඳහා පත් කරනු ලබන සහකාර පොලිස් සුපිරින්ටෙන්ඩන්ට් කෙනෙකුගේ තත්ත්වයට වඩා පහත් තත්ත්වයක නොවන පොලිස් නිලධරයකු විසින් නීත්‍යානුකූල දැයි විමසා බැලිය යුතු බවට මේ ආඥව මගින් විධිවිධාන සලස්වමි.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාරවරයා.

1961 නොවැම්බර 11,
කොළඹ.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2021—ජේ. ඇන්. ආර් 20195—6,400 (61/10)